**ගම්පහ ප්‍රාදේශීය සභාව - 2020**

---

1. **මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ගම්පහ ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට ගම්පහ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

-----------------------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද ,අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5. වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමග අනුරූප වේ

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතා අනුව ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබූ පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.
1.4.2 (ආ), 1.4.2 (ඇ)

1.6 **මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

1.6.1. **පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූල නොවීම**

| අදාල ප්‍රමිතයට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 3.9 | මූල්‍ය ප්‍රකාශනවල අයවැයගත තොරතුරු සන්සන්දනය කිරීමට පහසුවන ආකාරයට සත්‍ය, අයවැයගත සහ පෙර වූ තුලනාත්මක කාල පරිච්ඡේදයේ සත්‍ය වශයෙන් ඉදිරිපත් කළයුතු වටිනාකම් අතර යම් ප්‍රමාණාත්මක වෙනස්වීම් ඇත්නම් ඒවාට හේතු හෙළිදරව් නොකිරීම. | 3.9/3.15 පෙර වර්ෂවල පැවති පළාත් පාලන ආයතන සඳහා වූ ගිණුම් ක්‍රමය වෙනුවට රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය 2017 අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම ප්‍රථමවරට සිදු කරන ලද්දේ 2020 වර්ෂයේ සිට බැවින් පළාත්පාලන දෙපාර්තමේන්තුව මඟින් තවදුරටත් ලබාදෙන උපදෙස් මත ඉදිරියේ දී විගණනයෙන් පෙන්වා දී ඇති අවශ්‍යතා සපුරාලීමට කටයුතු කරමි. | ගිණුම්කරණ ප්‍රමිත වලට අනුව මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කළයුතු වේ. |

1.6.2. **ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2020 දෙසැම්බර් 31 දිනට රු.2,359,730 ක් වූ ලැබියයුතු වෙළඳ ස්ථාන කුලී නිසි අනුමැතියකින් තොරව සංචිත හා වෙන් කිරීමේ ගිණුමෙන් කපාහැර තිබීම හේතුවෙන් ලැබියයුතු වෙළඳ ස්ථාන කුලී එම වටිනාකමින් අඩුවෙන් ගිණුම්ගතකර තිබුණි. | ලබාදුන් උපදෙස් පරිදි නීත්‍යානුකූලව අයකර ගැනීමට නොහැකි බව හඳුනාගත් වෙළඳ ස්ථාන කුලී, සංචිත හා වෙන් කිරීමේ ගිණුමට මාරු කිරීමට කටයුතු කර ඇත. | ප්‍රමිත පරිදි ආදායම හඳුනාගෙන විධිමත් අනුමැතියක් ලබාගෙන සංචිත හා වෙන් කිරීමේ ගිණුමට ගැලපීමට ක්‍රියා කළයුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ආදායමට ගතයුතු ගලි බවුසර් ආදායම, කසළ අලෙවිය, සභාව විසින් දරන ලද පරිපාලන වියදම් සහ අතුරු බදු ක්‍රමය යටතේ කඩ අංක 05 පැවරීම සඳහා ලද ආදායම් එකතුව රු.647,957 ක් තැන්පතු ලෙස දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි. | ගලි බවුසර් ආදායම කසළ අලෙවිය හා අතුරු බදු ක්‍රමය යටතේ කඩ කාමර අංක 05 පැවරීමට අදාල මුදල් 2021 වර්ෂය තුල ආදායමට ගැනීමට කටයුතු කරමි. පරිපාලන වියදම් සම්බන්ධයෙන් ඉදිරි කාලය තුල දී පැවැත්වෙන විගණන හා කළමනා කරණ කමිටු රැස්වීමක දී මෙම ගැටළුව පිළිබඳව සාකච්ඡා කර සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත. | ආදායම ලෙස හඳුනාගැනීමට කටයුතු කළයුතු වේ. |
| (ඇ) | කොස්ගහලන්ද ඉඩමේ පිරිවැය හා වන්දි මුදල අතර වෙනස ආදායමක් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට ඉඩම් ගිණුමට බැර කර තිබීම හේතුවෙන් රු.235,842 ක් ඉඩම් ශේෂය සහ අතිරික්තය අඩුවෙන් දක්වා තිබුණි. | 2021 අවසාන ගිණුමෙන් නිවැරදි කරමි. | නිවැරදිව ගිණුම් පිළියෙල කළයුතු වේ. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වැඩ අවසන් නොකරන ලද මාර්ග, බෝක්කු සහ පාලම් සඳහා කොන්ත්‍රාත්කරුවන් වෙත ගෙවියයුතු රු.128,998,518 ක මුදල, කෙරීගෙන යන වැඩ ගිණුමට හර කරනු වෙනුවට වත්කම් ගිණුමට හර කර තිබුණි. | 2021 අවසාන ගිණුමෙන් නිවැරදි කරමි. | කෙරීගෙන යන වැඩ ලෙස හඳුනාගෙන ගිණුම්ගත කළයුතු වේ. |

### 1.6.3. ලැබිය යුතු ශේෂ

----------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව විමධ්‍යගත හා පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සඳහා ලැබිය යුතු ශේෂය රු.116,479,164 ක් තුල අයවීම් හිග හිටි වසර 1-3 දක්වා රු.11,288,287 ක් හා | විමධ්‍යගත හා පළාත් සභා යටතේ ක්‍රියාත්මක වන සංවර්ධන ව්‍යාපෘති සඳහා ලැබිය යුතු මුදල්, ලැබිය යුතු ශේෂ යටතේ දන්වා ඇත. මෙම මුදල් ලැබෙන ආකාරය අනුව ලේඛනගත කර ඇති අතර නොලැබෙන බව තහවුරු වන ශේෂ පමණක් ගිණුම්වලින් ඉවත් කර | ලැබියයුතු ශේෂ අයකරගැනීමට කටයුතු කළයුතු වේ. |

| | |
|---|---|
| වසර 5-10 දක්වා රු.2,667,712 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඇත. අනෙකුත් ශේෂ, මුදල් ප්‍රතිපූර්ණය වන තෙක් ඉදිරියට යනු ඇත. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1. මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.52,803,165 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.9,956,410 ක් විය.

**2.2. ආදායම් පරිපාලනය**

**2.2.1. වරිපනම් හා බදු**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| වරිපනම් හා බදු මූල්‍ය ප්‍රකාශන සහ අනුරූපී වාර්තා අනුව වටිනාකම් අතර රු.61,765 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර, ලැබියයුතු වරිපනම් ශේෂය රු.38,780,648 ක් තුල ගලහිටියාව උප කාර්යාලයේ වසර 10 ට වැඩි ශේෂය රු.5,887,319 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | වසර 10 ඉක්ම වූ හිඟ හිටි වරිපනම් බදු අයකර ගැනීම සඳහා වෙනමම ලේඛණයක් පිළියෙල කර එම ලේඛණයේ සඳහන් ලිපිනයන්ට අනුව සභාවේ නිලධාරීන් කණ්ඩායම් වශයෙන් යොදවා ගෙයින් ගෙට ගොස් හිඟ වරිපනම් බදු එකතු කිරීමේ වැඩපිළිවෙලක් ප්‍රායෝගිකව සකස් කර ක්‍රියාත්මක කරමින් සිටින අතර තුර Covid වසංගත තත්වය 2020 ඔක්තෝබර් මාසයේ සිට දෙසැම්බර් අවසානය දක්වාම නැවත හිස එසවීම තුලින් අදාළ වරිපනම් හිඟ මුදල් එකතු කිරීම නැවතත් අඩාල විය. ඒ අනුව වසර 10 ට වැඩි හිඟ වරිපනම් ශේෂය අවම කර ගැනීමට ගත් පියවරයන් අඩාල විය. | හිඟ බදු අයකිරීමේ ක්‍රියාමාර්ග වැඩිදියුණු කළයුතු වේ. |

**2.2.2. කඩ කුලී**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| කඩකුලී හිඟ ආදායම් කාල විශ්ලේෂණයට අනුව අවුරුදු 3-5 අතර ශේෂය රු.223,580 ක්, අවුරුදු 5-10 අතර ශේෂය රු.594,234 ක්, අවුරුදු 10 ට වැඩි ශේෂය රු.1,446,235 ක් | හිඟ කඩ කුලී අයකර ගැනීමේ ප්‍රතිශතය අනුව වසර 10 කට වඩා වැඩි කාලයක සිට කඩ කුලී නොගෙවන ලද ව්‍යාපාර | කඩ කුලී අයකරගැනීම යාවත්කාලීනව කළයුතු වේ. |

| | | |
|---|---|---|
| පැවතුණ අතර හෙනරත්ගොඩ උප කාර්යාලයට අයත් මුද්‍රා තබන ලද කඩ කාමර 05 කින් හා මුද්‍රා නොතබන ලද කඩ කාමර 06 කින් අයවියයුතු හිඟ මුදල රු.734,867 ක් හා දඩ මුදල රු.75,877 ක් අයකරගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කර නොතිබුණි | ස්ථානවල බදුකරුවන් සොයාගත නොහැකි හා ඇතැම් බදුකරුවන් මියගොස් ඇති ව්‍යාපාරික ස්ථාන ගණනාවක් පවතින බැවින් එම ස්ථාන හඳුනාගෙන අදාළ බිල්කිරීම් ලේඛනවලින් ඉවත් කිරීම සඳහා පළාත් පාලන කොමසාරිස් මඟින් බස්නාහිර පළාත් ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කර ඇත. | |

2.2.3. **වෙනත් ආදායම්**

------------------

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා සම්ප්‍රේෂණ කුළුණු 40 කින් ව්‍යාපාර බදු අයකර තිබුණද 2020 වර්ෂය සඳහා කුළුණු 29 කින් පමණක් බදු අයකර තිබුණි. | ප්‍රාදේශීය සභාවට අයත් හෙනරත්ගොඩ උප කාර්යාලයට අයත් දුරකථන කුළුනු 07 කට සහ ගලහිටියාව උප කාර්යාලයට අයත් කුළුනු 4 ක් සඳහා ව්‍යාපාර බදු මුදල් ගෙවා නොමැති අතර එම තත්වය පිළිබඳව අදාළ දුරකථන කුළුනු අයත් සමාගම් වෙත මේ වන විටත් ලිඛිතව දන්වා යවා ඇති අතර එය නොපමාව අයකර ගැනීමට කටයුතු කරමි. | නොපමාව අයකර ගතයුතු වේ. |

3. **මෙහෙයුම් සමාලෝචනය**

-----------------------------

**3.1. කාර්යසාධනය**

-----------------

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය සහ සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| **විගණන නිරීක්ෂණය** | **සභාවේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| ගණේමුල්ල පැරණි තැපැල් කාර්යාල භූමිය ටැලන්ට් තාක්ෂණ හා කළමනාකරණ ආයතනයට ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව බදුදී තිබූ නිසා 2010 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවට අයවියයුතු කුලිය හා දඩය රු.1,446,235 ක් අයකරගැනීම සඳහා නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකිවී තිබුණි. | එවකට ගිවිසුම් අත්සන් කිරීමකින් තොරව අදාළ ස්ථානය බදුදීම හේතුවෙන් නීත්‍යානුකූලව කටයුතු කිරීමට නොහැකි වී ඇත. එසේ වුවද අදාළ නිලධාරීන් විසින් හිඟ බදු මුදලින් රු.102,564 ක් අයකර ගැනීමට කටයුතු කර ඇත. | හිඟ අයකරගැනීමට කටයුතු කළයුතු අතර බදු දීමේදී ගිවිසුමක් අත්සන් කිරීම අනිවාර්යය වේ. |